# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## 2020 පෙබරවාරි මස 07 වන දින

## II වන කොටස

## අතිරේකය

(2020.02.10 දින නිකුත් කරන ලදී)

## එකතු කළ අගය මත බදු (සංශෝධන)

**2002 අංක 14 දරන එකතු කළ අගය මත බදු පනත සංශෝධනය කිරීම සඳහා වූ පනත් කෙටුම්පතකි**

මුදල්, ආර්ථික සහ ප්‍රතිපත්ති සංවර්ධන අමාත්‍යතුමාගේ නියමය පරිදි පළකරන ලදී


ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.

කොළඹ 5, රජයේ ප්‍රකාශන කාර්යාංශයෙන් මිල දී ලබාගත හැක.

මිල : රු. 12.00 තැපැල් ගාස්තුව : රු. 15.00

මෙම ගැසට් අතිරේකය www.documents.gov.lk වෙබ් අඩවියෙන් බාගත කළ හැක.

**නීතිය බලපෑමේ ප්‍රකාශය**

***2 වන වගන්තිය :*** මේ වගන්තිය මඟින් (මෙහි මින්මතු ''ප්‍රධාන ප්‍රඥප්තිය'' යනුවෙන් සඳහන් කරනු ලබන) 2002 අංක 14 දරන එකතු කළ අගය මත බදු සංශෝධන පනතේ 3 වන වගන්තිය සංශෝධනය කරනු ලබන අතර, සංශෝධිත පරිදි එම වගන්තියේ නීතිය බලපෑම වනුයේ, තොග සහ සිල්ලර වෙළෙඳාම සඳහා එකතු කළ අගය මත බදු වගකීම සඳහා වන අගය වැඩි කිරීම වේ.

***3 වන වගන්තිය :*** මේ වගන්තිය මඟින් ප්‍රධාන ප්‍රඥප්තියේ 10 වන වගන්තිය සංශෝධනය කරනු ලබන අතර, සංශෝධිත පරිදි එම වගන්තියේ නීතිය බලපෑම වනුයේ, එකතු කළ අගය මත බදු වගකීම ලියාපදිංචි කිරීම සඳහා බද්දට යටත් සීමාව මාස තුනක් සඳහා මිලියන හැත්තෑ පහක් සහ වසරක් සඳහා රුපියල් මිලියන තුන්සියයක් දක්වා වැඩි කිරීම සහ ඊට සම්බන්ධ ආනුෂංගික සංශෝධන වේ.

***4 වන වගන්තිය :*** මේ වගන්තිය මඟින් ප්‍රධාන ප්‍රඥප්තියේ 12 වන වගන්තිය සංශෝධනය කරනු ලබන අතර, සංශෝධිත පරිදි එම වගන්තියේ නීතිය බලපෑම වනුයේ එම වගන්තියේ විස්තරකොට ඇති තැනැත්තන්ට මේ පනත යටතේ ස්වේච්ඡාවෙන් ලියාපදිංචි වීම සඳහා විධිවිධාන සැලැස්වීම වේ.

***5 වන වගන්තිය :*** සහාධිපත්‍ය නිවාස ඒකක සැපයීම සහ තොරතුරු තාක්ෂණය සහ සඵල සේවා සඳහා පනවා ඇති බදු නිදහස් කිරීම් සඳහා මේ වගන්තිය මඟින් ප්‍රධාන ප්‍රඥප්තියේ පළමුවන උපලේඛනයේ II වන කොටස සංශෝධනය කරනු ලැබේ.

**එකතු කළ අගය මත බදු (සංශෝධන)**

එල්.ඩී.—ඕ. 60/2019

## 2002 අංක 14 දරන එකතු කළ අගය මත බදු පනත සංශෝධනය කිරීම සඳහා වූ පනතකි

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ පාර්ලිමේන්තුව විසින් මෙසේ පනවනු ලැබේ:—

ලුහුඬු නාමය.

**1.** මේ පනත 2020 අංක  දරන එකතු කළ අගය මත බදු (සංශෝධන) පනත යනුවෙන් හඳුන්වනු ලැබේ.

2002 අංක 14 දරන පනතේ 3 වන වගන්තිය සංශෝධනය කිරීම.

**2.** (මින්මතු “ප්‍රධාන ප්‍රඥප්තිය” යනුවෙන් සඳහන් කරනු ලබන) 2002 අංක 14 දරන එකතු කළ අගය මත බදු පනතේ 3 වන වගන්තිය, එහි (1) වන උපවගන්තියේ (ඊ) ඡේදය පහත දැක්වෙන පරිදි සංශෝධනය කිරීම මඟින් මෙයින් සංශෝධනය කරනු ලැබේ:—

(1) (iv) වන අනුඡේදයේ “2016 නොවැම්බර් මස 1 වන දින හෝ එදිනට පසු” යන වචන සහ ඉලක්කම් වෙනුවට “2016 නොවැම්බර් මස 1 වන දින සහ එදිනට පසු එහෙත් 2019 දෙසැම්බර් මස 31 වන දින හෝ එදිනට පෙර අවසන් වන” යන වචන සහ ඉලක්කම් ආදේශ කිරීම මඟින්;

(2) (iv) යන අනුඡේදයට ඉක්බිතිව ම පහත දැක්වෙන අලුත් අනුඡේදය ඇතුළත් කිරීමෙන්:—

“(v) 2020 ජනවාරි මස 1 වන දින සහ එදිනට පසු ආරම්භ වන යම් මාස තුනක කාලසීමාවක් සඳහා රුපියල් මිලියන හැත්තෑ පහක් වන,”.

ප්‍රධාන ප්‍රඥප්තියේ 10 වන වගන්තිය සංශෝධනය කිරීම.

**3.** ප්‍රධාන ප්‍රඥප්තියේ 10 වන වගන්තිය පහත දැක්වෙන පරිදි මෙයින් සංශෝධනය කරනු ලැබේ:—

(1) එම වගන්තියේ (1) වන උපවගන්තියේ-

(අ) (v) වන ඡේදයේ “2016 අප්‍රේල් මස 1 වන දින හෝ ඉන්පසු,” යන වචන සහ ඉලක්කම් වෙනුවට “2016 අප්‍රේල් මස 1 වන දින සහ එදිනට පසු, එහෙත් 2020 ජනවාරි මස 1 වන දිනට පෙරාතුව” යන වචන සහ ඉලක්කම් ආදේශ කිරීමෙන්;

(ආ) එහි (v) වන ඡේදයට ඉක්බිතිව ම පහත දැක්වෙන අලුත් ඡේදය ඇතුළත් කිරීමෙන්:—

"(vi) 2020 ජනවාරි මස 1 වන දින සහ එදිනට පසු ශ්‍රී ලංකාව තුළ යම් බදු අය කළ හැකි ක්‍රියාකාරකමක් කරනු ලබන හෝ කරගෙන යනු ලබන්නා වූ යම් තැනැත්තකු විසින්-

(අ) අවස්ථාවෝචිත පරිදි, යම් බදු අය කළ හැකි එක් මාසයක හෝ මාස තුනක කාලසීමාව අවසානයේ දී, එම තැනැත්තා විසින්, අවස්ථාවෝචිත පරිදි, එම බදු අය කළ හැකි එක් මාසයක හෝ මාස තුනක කාලසීමාව ඇතුළත ශ්‍රී ලංකාව තුළ දී කරන ලද බදු අය කළ හැකි භාණ්ඩ හෝ සේවා හෝ භාණ්ඩ සහ සේවා සැපයුම්වල සමස්ත වටිනාකම රුපියල් මිලියන හැත්තෑ පහක් වේ නම්; හෝ

(ආ) එවකට අවසන් වන මාස දොළහක කාලසීමාව තුළ දී, එම තැනැත්තා විසින් ශ්‍රී ලංකාව තුළ කරන ලද බදු අය කළ හැකි භාණ්ඩ හෝ සේවා හෝ භාණ්ඩ සහ සේවා සැපයුම්වල සමස්ත වටිනාකම රුපියල් මිලියන තුන්සියයක් ඉක්මවා ඇත්නම්; හෝ

(ඇ) යම් අවස්ථාවක දී, අවස්ථාවෝචිත පරිදි, ඉදිරියේ දී එළඹෙන බදු අයකළ හැකි එක් මාසයක හෝ මාස තුනක කාලසීමාව තුළ එම තැනැත්තාගේ ශ්‍රී ලංකාව තුළ බදු අය කළ හැකි භාණ්ඩ හෝ සේවා හෝ භාණ්ඩ සහ සේවා සැපයුම්වල සමස්ත වටිනාකම රුපියල් මිලියන හැත්තෑ පහක් ඉක්මවීමට ඉඩ ඇති බවට හෝ ඉදිරියේ දී එළඹෙන මාස දොළහක කාලසීමාව සඳහා රුපියල්

මිලියන තුන්සියයක් ඉක්මවීමට ඉඩ ඇති බව හෝ විශ්වාස කිරීමට සාධාරණ හේතු ඇත්නම්,

එම තැනැත්තා මේ පනත යටතේ ලියාපදිංචි විය යුතු ය.".

(2) එම වගන්තියේ (2) වන උපවගන්තියේ-

(අ) (ඇ) අනුඡේදයේ "රුපියල් මිලියන සියයකට නොඅඩු වන්නේ නම් මිස," යන වචන සහ ඉලක්කම් වෙනුවට "රුපියල් මිලියන සියයකට නොඅඩු වන්නේ නම් මිස;"; යන වචන සහ ඉලක්කම් ආදේශ කිරීමෙන්;

(ආ) (ඈ) අනුඡේදයේ "2016 නොවැම්බර් මස 1 වන දින හෝ එදිනට පසුව" යන වචන සහ ඉලක්කම් වෙනුවට "2016 නොවැම්බර් මස 1 වන දින සහ එදිනට පසුව එහෙත් 2019 දෙසැම්බර් මස 31 වන දින හෝ එදිනට පෙර අවසන් වන," යන වචන සහ ඉලක්කම් ආදේශ කිරීමෙන්;

(ඇ) එම (ඈ) අනුඡේදයට ඉක්බිතිව ම පහත දැක්වෙන අනුඡේදය ඇතුළත් කිරීමෙන්:—

"(ඉ) 2020 ජනවාරි මස 1 වන දින සහ එදිනට පසු ආරම්භ වන යම් මාස තුනක කාලසීමාවක් සඳහා රුපියල් මිලියන හැත්තෑ පහක් වන,".

4. ප්‍රධාන ප්‍රඥප්තියේ 12 වන වගන්තිය මෙයින් ඉවත් කරනු ලබන අතර, ඒ වෙනුවට පහත දැක්වෙන වගන්තිය ආදේශ කරනු ලැබේ:— ප්‍රධාන ප්‍රඥප්තියේ 12 වන වගන්තිය ප්‍රතියෝජනය කිරීම.

"ස්වේච්ඡාවෙන් ලියාපදිංචි වීම. 12. 3 වන සහ 10 වන වගන්තිවල විධිවිධානවල කුමක් සඳහන්ව ඇත ද, භාණ්ඩ හෝ සේවා සපයනු ලබන සහ බදු අයකළ හැකි ක්‍රියාකාරකමක් කරගෙන යනු ලබන හෝ යම් බදු අයකළ හැකි භාණ්ඩ ආනයනය කරනු ලබන යම් තැනැත්තකු විසින්-

(අ) 2013 ජනවාරි මස 1 වන දිනට පෙරාතුව වූ බදු අයකළ හැකි යම් කාලසීමාවක් සඳහා:

එසේ වුව ද, කොමසාරිස්-ජනරාල්වරයා විසින් එවැනි තැනැත්තකුට කරුණු කියා සිටීමට අවස්ථාව ලබා දීමෙන් පසු, ඒ තැනැත්තා කරගෙන යන ලද ව්‍යාපාරයේ ස්වභාවය, බදු අයකර ගත හැකි පූර්ව කාලසීමා දෙකෙහි ඒ තැනැත්තා විසින් කරන ලද බදු අයකළ හැකි සැපයීම්වල වටිනාකම සහ ඔහුගේ බදු අයකළ හැකි සැපයුම්වල වටිනාකම 10 වන වගන්තියේ දක්වා ඇති වටිනාකම නොඉක්මවන බව සැළකිල්ලට ගෙන කොමසාරිස්-ජනරාල්වරයා විසින් ඒ තැනැත්තා ලියාපදිංචි කිරීම ප්‍රතික්ෂේප කළ හැකි ය; සහ

(ආ) 2020 ජනවාරි මස 1 වන දින සහ එදිනට පසු ආරම්භ වන යම් බදු අයකළ හැකි කාලසීමාවක් සඳහා,

මේ පනත යටතේ ලියාපදිංචි වීම සඳහා කොමසාරිස්-ජනරාල්වරයා වෙත නියමිත ආකෘති පත්‍රයෙන් ඉල්ලුම්පතක් ඉදිරිපත් කළ හැකි ය.”.

ප්‍රධාන ප්‍රඥප්තියේ පළමුවන උපලේඛනය සංශෝධනය කිරීම.

**5.** ප්‍රධාන ප්‍රඥප්තියේ පළමුවන උපලේඛනයේ II වන කොටස පහත දැක්වෙන පරිදි මෙයින් සංශෝධනය කරනු ලැබේ:—

(1) (ආ) ඡේදයේ (xi) අයිතමයේ (ඇ) අනු අයිතමයේ “2019 අප්‍රේල් මස 1 වන දින හෝ එදිනට පසුව සිදු වී ඇත්නම්,” යන වචන සහ ඉලක්කම් වෙනුවට “2019 අප්‍රේල් මස 1 වන දින සහ එදිනට පසුව ආරම්භව එහෙත් 2019 දෙසැම්බර් මස 1 වන දිනෙන් අවසන් වී ඇත්නම්,” යන වචන සහ ඉලක්කම් ආදේශ කිරීම මගින්;

(2) (ඇ) අනු අයිතමයට ඉක්බිතිව ම පහත දැක්වෙන අනු අයිතමය ඇතුළත් කිරීමෙන්:—

"(ඈ) 2019 දෙසැම්බර් මස 1 වන දිනෙන් ආරම්භ වන, යම් තැනැත්තකු විසින් කරනු ලබන පදිංචිය සඳහා වන නිවාස බදුදීමක් හෝ කුලියට දීමක් නොවන සැපයුම්.".

(3) (Li) සහ (Lii) යන අයිතමයන් (2018 අංක 25 දරන එකතු කළ අගය මත බදු (සංශෝධන) පනත මගින් ඇතුළත් කරන ලද පරිදි) පිළිවෙලින් (Lii) සහ (Liii) ලෙස නැවත අංකනය කිරීමෙන්;

(4) නැවත අංකනය කරන ලද (Liii) යන අයිතමයට ඉක්බිතිව ම පහත දැක්වෙන අයිතමය ඇතුළත් කිරීම මගින්:—

"(Liv) 2020 ජනවාරි මස 1 වන දිනෙන් ආරම්භ වන තොරතුරු තාක්ෂණය සහ නියම කරනු ලැබිය හැකි සඵල සේවා.".

අනනුකූලතාවක් ඇති වූ විට සිංහල භාෂා පාඨය බලපැවැත්විය යුතු බව.

**6.** මේ පනතේ සිංහල සහ දෙමළ භාෂා පාඨ අතර යම් අනනුකූලතාවක් ඇතිවුවහොත්, එවිට, සිංහල භාෂා පාඨය බලපැවැත්විය යුතු ය.